දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) MH/ TA/ SP/ PHA/ 02/ 2022
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.05. 17
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

රජයේ අමාත්‍යාංශයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්/ ආයතන ප්‍රධානීන් වෙත,

විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් ඖෂධවේදී තනතුරේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (2019.01.01 දින සිට 2021.12.31 දින දක්වා)</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2024.05.10 දිනැතිව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ ලිපි අංක 02 – 75 / 2024 හා බැදේ.

02. ඒ අනුව, එම පොදු චක්‍රලේඛ ලිපියෙ හි 06 වගන්තිය යටතේ සඳහන් ලකුණු පරිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්ගේ අංක HSC/ PRO/ Pharmacist/ 06/ 02/ 2023 හා 2025.04.01 දිනැති ලිපිය මගින් සංශෝධනය කර ඇති අතර ඊට අදාලව සංශෝධිත ලකුණු පරිපාටිය ඇමුණුම I හා ඇමුණුම II මගින් දක්වා ඇත.

03. එසේම, මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් යොමු කර ඇති නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතාවයෙන් ඉහළ නිලධාරීන් හතළිස් දෙදෙනෙකු (42) සම්මුඛ පරීක්ෂණ දිනයේ දී අමාත්‍යාංශය වෙත කැඳවීම් සිදු කරනු ලැබේ. එම කැඳවීම් කරන ලද නිලධාරීන් විසින් ඇමුණුම I මගින් දක්වා ඇති ලකුණු පරිපාටියෙ හි දක්වා ඇති ලකුණු ලබා ගැනීම සඳහා වන ලේඛන තමා විසින්ම සහතික කොට, ආයතන ප්‍රධානීන්ගෙන් සත්‍ය පිටපතක් බවට තහවුරු කරගෙන එදිනට ඉදිරිපත් කල යුතුය.

04. මීට අමතරව පොදු චක්‍රලේඛ ලිපි අංක 02 – 75 / 2024 හා 2024.05.10 දිනැති චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව තවදුරටත් දන්වා සිටිමි.

Chamo

චාමික එච්. ගමගේ,
අතිරේක ලේකම් (පාලන) II,
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ඇමුණුම I

06. **ලකුණු දීමේ ක්‍රමය -**

**6.1 ජ්‍යෙෂ්ඨතාවය** **(උපරිම ලකුණු 60)**

I ශ්‍රේණියේ සේවා කාලය සඳහා උපරිම ලකුණු 20

අධි ශ්‍රේණියේ සේවා කාලය සඳහා උපරිම ලකුණු 40

**සටහන** - රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/ 2019 අනුව ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන අතර තනතුරට අයදුම් කිරීම සඳහා අවශ්‍යවන මූලික සුදුසුකම සඳහා අදාළ කරගනු ලබන සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

**6.2 කුසලතාවය** **(උපරිම ලකුණු 40)**

**I. අතිරේක අධ්‍යාපන සුදුසුකම්** **(උපරිම ලකුණු 30)**

විෂයානුබද්ධ සිව් අවුරුදු විශේෂවේදී උපාධියක් - ලකුණු 25
විෂයානුබද්ධ විද්‍යාවේදී උපාධියක් - ලකුණු 20
කළමණාකරන ක්ෂේත්‍රයේ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ උපාධියක් - ලකුණු 15
විෂයානුබද්ධ උසස් ඩිප්ලෝමාවක් / ඩිප්ලෝමාවක් - ලකුණු 10
කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ
උසස් ඩිප්ලෝමාවක් / ඩිප්ලෝමාවක් - ලකුණු 05

**II. විශේෂ කුසලතා** **(උපරිම ලකුණු 10)**

සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ප්‍රකාශයට පත් කර ඇති විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන ( Research Publication) මේ යටතේ බඳවා ගැනීමේ සුදුසුකමට අදාල උපාධියේ හෝ මීත් පෙර ලකුණු උපයාගත් කිසියම් උපාධියකට අදාල පර්යේෂණ නිබන්ධන සලකා බලනු නොලැබෙන අතර පිළිගත් ජර්නලයක හෝ වෙබ් අඩවියක අදාල පර්යේෂණය ප්‍රකාශයට පත් කර ප්‍රසිද්ධියට පත් කර තිබිය යුතුය.

පළමු කර්තෘ ලෙස ප්‍රකාශිත පර්යේෂණ ප්‍රකාශන 01ට - ලකුණු 05 බැගින්

ප්‍රකාශිත පර්යේෂණ ප්‍රකාශනයක සහභාගීත්වය සඳහා - ලකුණු 02 බැගින්

**සැලකිය යුතුයි -**

i. අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා, තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකමට අදාල වූ අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

ii. උපාධි සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත ආයතනයකින් ලබා තිබිය යුතු අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ඩිප්ලෝමා/ සහතික පත්‍ර පාඨමාලා පමණක් මෙහි දී සලකනු ලබයි.

iii. තනතුරට අයත් රාජකාරි ක්ෂේත්‍රයට අදාල ඩිප්ලෝමාව මාස 06කට වැඩි විය යුතු අතර තනතුරට අයත් රාජකාරි ක්ෂේත්‍රයට අදාල සහතික පත්‍ර පාඨමාලාව මාස 03කට නොඅඩු විය යුතුය.

සටහන : 6.2.II සඳහා ලකුණු ලබා දිය යුතු ආකාරය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

<u>පර්යේෂණ / ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. ප්‍රකාශන :

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර ඇති අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා / උද්ධෘත / අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යයන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

**<u>සැ.යු. : උක්ත ප්‍රකාශන එකී අවස්ථාවන් සඳහා යොදාගත් බව සනාථ කිරීම අයදුම්කරුගේ වගකීම වේ.</u>**

II. කතෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් සහභාගී වූ කතෘන් අතර සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.

III. එකම දත්ත / පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි / පශ්චාත් උපාධි පුහුණුවෙහි කොටසක් ලෙස පළකරන ලද ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

V. ඉහත සියලුම ප්‍රකාශන අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පෙර ප්‍රකාශයට පත් කර තිබිය යුතුය.